# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No: 517

ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail: dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No: 442 / 2023

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.04.09 පැය 2140

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**දියේ ගිලී මියයාමක් - මහනුවර පොලිස් වසම.**

2023.04.09 වන අද දින සවස් කාලයේ මහනුවර පොලිස් වසමේ මහවැලි ගඟේ පොල්ගොල්ල වේල්ලට මීටර් 300 ක් පමණ පහලින් දිය නාමින් සිටි පාසල් සිසුන් 04 දෙනෙකු අතරින් සිසුන් දෙදෙනෙකු දියේ ගිලී ඇති බවට පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. මෙලෙස දියේ ගිලී ඇති සිසුන් දෙදෙනා ප්‍රදේශවාසීන් විසින් ගොඩට ගෙන මහනුවර රෝහල වෙත ඇතුලත් කිරීමේදී එක් සිසුවෙක් මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වූ මහනුවර තිත්තවෙල පාර ප්‍රදේශයේ පදිංචි කටුගස්තොට සහිරා විද්‍යාලයේ 11 වන වසරේ ඉගෙණුම ලැබූ සිසුවෙකි.**

එම පාසලේම ඉගෙණුම ලබන වයස අවුරුදු 13 වන අනෙක් සිසුවා මේ වන විට මහනුවර රෝහලේ ප්‍රතිකාර ලබයි. මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**